# සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

## සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සත්ත්ව සංවර්ධන උපදේශක තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියේ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම් ලත් සබරගමුව පළාතේ පදිංචි අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

02. අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය :- 2026.03.20

03. 3:1 පොදු සුදුසුකම් :-

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය.

(ii) යම් ආගමික නිකායක පැවිදිවරයක් දරණ කිසිදු තැනැත්තෙකු මෙම තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට සුදුසුකම් නොලබයි.

(iii) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයෙන් යුක්ත විය යුතුය.

(iv) **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට** අයදුම්කරු සබරගමුව පළාත තුළ ස්ථිර පදිංචි අයෙකු විය යුතු අතර, **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට** පූර්වාසන්න වසර 03 තුළ අයදුම්කරුට සබරගමුව පළාතේ වසර 03ක ස්ථිර පදිංචිය නොමැත්තේ නම් අයදුම්කරුගේ කලත්‍රයා **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට** පූර්වාසන්න වසර 03ක කාලය තුළ සබරගමුව පළාතේ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.

(v) අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවු. 18 ට නොඅඩු සහ 35 ට නොවැඩි විය යුතුය.

(vi) බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ අයදුම්කරු අදාළ සියලු සුදුසුකම් හා නියමිත වයස් සීමාව **අයදුම්පත් භාර ගන්නා අවසන් දින** වන විට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

(vii) **අයදුම්පත් භාර ගන්නා අවසන් දිනය** වන විට මෙම ක්ෂේත්‍රයට අදාළව අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් ලබා තිබීම අනිවාර්ය වේ.

3:2. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්

| අධ්‍යාපන සුදුසුකම් | | වෘත්තීය සුදුසුකම් |
|---|---|---|
| **තනතුර සඳහා අ.පො.ස. (සා. පෙළ) සුදුසුකම** | **තනතුර සඳහා අ.පො.ස. (උ. පෙළ) සුදුසුකම** | |
| මව්බස (සිංහල /දෙමළ/ඉංග්‍රීසි භාෂාව) විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර(සාමාන්‍ය පෙළ) විභාගය සමත්වීම | අධ්‍යාපන පොදු සහතික පත්‍ර(උසස් පෙළ) විභාගයේ ජෛව විද්‍යා විෂය ධාරාව යටතේ (ජෛව විද්‍යාව සමග රසායන විද්‍යාව, භෞතික විද්‍යාව කෘෂි විද්‍යාව, යන විෂයයන්ගෙන් දෙකක්) හෝ ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාව යටතේ(ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂි විද්‍යාව) විෂයයන් තුනකින් එකවර සමත්වී තිබීම (සාමාන්‍ය පොදු පරීක්ෂණය හා සාමාන්‍ය ඉංග්‍රීසි විෂයයක් ලෙස ගණන් ගනු නොලැබේ) | I. සත්ත්ව නිෂ්පාදන හා සත්ත්ව සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලබන සත්ත්ව පාලන පුහුණුව පිළිබඳ විද්‍යාලයකින් ලබා ගන්නා ලද සත්ත්ව පාලන ඩිප්ලෝමා සහතිකය<br>හෝ<br>II. අනුරාධපුර/සිප්පුකුලම සත්ත්ව පාලන පුහුණු මධ්‍යස්ථාන මගින් නිකුත් කරනු ලබන ඇවුරුදු ඩිප්ලෝමා සහතිකය<br>හෝ<br>III. කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලය මගින් නිකුත් කරනු ලබන ඇවුරුදු ඩිප්ලෝමා සහතිකය |

සටහන :- පවතින පුරප්පාඩු සංඛ්‍යාව 06 කි.

04. **මෙම තනතුරට අදාල වැටුප් පරිමාණය :-**

අංක 10/2025 හා 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව මෙම තනතුරේ III වැනි ශ්‍රේණියට අදාළ වැටුප් කාණ්ඩය MN 3 – 2025 වන අතර මාසික වැටුප් පරිමාණය රු. 52,250- 10×800- 11×1190- 10×1320- 10×1350 - රු. 100,040/- වේ.

05. III ශ්‍රේණියේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට අයදුම්කරු යටත් විය යුතුවේ.

06. බඳවා ගැනීමේ ක්‍රමය:-

ලිඛිත තරඟ විභාගයක ප්‍රතිඵල මත රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 15/90 විධිවිධාන පරිදි දිස්ත්‍රික් ජන අනුපාතය මත දිස්ත්‍රික් කුසලතා අනුපිළිවෙල පදනම් කර ගනිමින් බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකට භාජනය කර බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. තරඟ විභාගය සමත්වීම සඳහා එක් එක් ප්‍රශ්න පත්‍රයට ලබා ගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40 % කි.

<u>බඳවා ගැනීමේ ලිඛිත තරඟ විභාගයේ විෂයය නිර්දේශය:</u>

1. බුද්ධි පරීක්ෂණය - කාලය පැය 01 යි. - ලකුණු 100 යි.
   අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාව, විශ්ලේෂණ හැකියාව, කාල කළමනාකරණය විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්ත බහුවරණ ප්‍රශ්න පත්‍රයකි.

2. විෂයානුබද්ධ තාක්ෂණ ප්‍රශ්න පත්‍රය - කාලය පැය 03 යි. - ලකුණු 100 යි.
   තනතුරට අදාළව තාක්ෂණික දැනුම මැන බැලෙන පහත කරුණු වලින් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

   i ශ්‍රී ලංකාවේ සත්ත්ව පාලන කටයුතු පිළිබඳ පවත්නා, සම්පත් විභවයන් වර්තමාන තත්ත්වයන් හා ආර්ථිකයට ඇති දායකත්වය.
   ii ශ්‍රී ලංකාවේ සත්ත්ව නිෂ්පාදන රටා, නිෂ්පාදන ප්‍රමාණයන් හා අලෙවිකරන ක්‍රම, ශ්‍රී ලංකාවේ පවතින සත්ත්ව පාලන ගොවිපල රටා, එවායේ පිහිටීම හා විසිරීම.
   iii ගොවිපල සතුන් අභිජනනය සඳහා බහුලව යොදා ගන්නා ක්‍රම
   iv බෝවන සත්ත්ව රෝග, සත්ත්ව රෝග මර්ධන ක්‍රියා පිළිවෙත්, රෝගී සතුන්ගේ නියැදි රැස් කිරීම හා ප්‍රවාහනය.
   v ඒකාබද්ධ ගොවිපල් ක්‍රම හා ප්‍රතිචක්‍රියකරන ක්‍රම
   vi සත්ත්ව පාලන හා ආශ්‍රිත කර්මාන්ත කිරි සැකසීම, මස් සැකසීම, සත්ත්ව ආහාර නිෂ්පාදනය
   vii සත්ත්ව නිෂ්පාදන ක්‍රියාවලියට අදාළ ආදායම් වියදම් ගණනය ක්‍රම, ගොවිපල් වාර්තාකරණය හා ගිණුම් විශ්ලේෂණය, සත්ත්ව ගොවිපල් සැලසුම්කරණය
   viii විද්‍යාත්මක තොරතුරු ප්‍රචාරණ ක්‍රම භාවිතය හා ඒවායේ ඵලදායිතාවයන්

මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් හෝ සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් විසින් සිංහල හා දෙමළ භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. ලැබෙන අයදුම්පත් සංඛ්‍යාව අනුව විභාගය පවත්වන නගරය තීරණය කරනු ලැබේ. විභාගයේදී අනන්‍යතාව තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය පමණක් පිළිගනු ලැබේ.

(I) කුසලතා අනුපිළිවෙල අනුව පුරප්පාඩු පුරවාගෙන යාමේදී පුරප්පාඩු සංඛ්‍යාවට වැඩි සංඛ්‍යාවක් සම ලකුණු ලබාගත් සුදුසුකම්ලත් අපේක්ෂකයින් සිටී නම් එසේ සම ලකුණු ලබාගත් අපේක්ෂකයින් අතුරින් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2024 අනුව පහත සඳහන් පරිදි වැඩිදුර තෝරාගැනීමක් සිදුකිරීමට සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබිය හැකිය.

   a. අපේක්ෂකයින්ගේ හැකියාව ඇගයීම සඳහා වූ ලිඛිත පරීක්ෂණය
   b. කුසලතා පාදක සම්මුඛ පරීක්ෂණය

## 07 අයදුම් කිරීමේ ක්‍රමය

7:1 මෙම නිවේදනයේ අගට යොදා ඇති ආදර්ශ අයදුම්පත්‍රය ප්‍රකාරව ඒ-4 ප්‍රමාණයේ කඩදාසිවල දෙපැත්ත ප්‍රයෝජනයට ගනිමින් අනු අංක 01 සිට 03 තෙක් ඡේදයන් පළමුවන පිටුවටද අංක 04 සිට 06 තෙක් දෙවන පිටුවටද වශයෙන් ඇතුළත් වන සේ පිළියෙල කරගත් අයදුම්පත්‍රය තම අත්අකුරින්ම පිරවිය යුතුය. ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7.2 මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. තරග විභාගයට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා බඳවා ගැනීමේ නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. අයදුම්කරු විසින් විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය වේ.

7.3 විභාග ගාස්තුව රු. 600/- කි. මෙම විභාග ගාස්තුව සබරගමුව පළාත් සභාවේ **20.03.02.99** දරන ආදායම් ශීර්ෂයට බැරවන ලෙස සබරගමුව පළාත් සභාවේ ඕනෑම අමාත්‍යාංශ කාර්යාලයකට/ දෙපාර්තමේන්තුවකට (පළාත් පාලන ආයතන හැර) හෝ සබරගමුව පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඒ සඳහා නිකුත් කරන කුවිතාන්සිය අයදුම් පත්‍රයේ අදාල කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුවේ. (කුවිතාන්සියේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතුය.) ගෙවන ලද විභාග ගාස්තුව කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාරගනු නොලැබේ. ඉහත සඳහන් ආයතන වලට හැර වෙනත් කාර්යාලවලට (තැපැල් කාර්යාල, බැංකු) මුදල් ගෙවන ලද කුවිතාන්සි භාරගනු නොලැබේ.

7:4 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.03.20 දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් **ලේකම්, සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, පළාත් සභා කාර්යාල සංකීර්ණය, නවනගරය, රත්නපුර** යන ලිපිනයට එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ **"සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සත්ත්ව සංවර්ධන උපදේශක III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026"** යනුවෙන් සඳහන් කළයුතුය. නියමිත දිනට පසු ලැබෙන ඉල්ලුම්පත්, තනතුරට අදාළ සුදුසුකම් සපුරා නොමැති සහ අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7:5 අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා, නිවේදනයට අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නොමැති බව හෙළිවුවහොත් ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කරුණක් වේනොත් ඒ පිළිබඳව සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වන්නේය. එසේම මෙම බඳවා ගැනීමේ නිවේදනය අනුව මෙම පුරප්පාඩු හා ඉදිරියේදී ඇති වන පුරප්පාඩු පිරවීම හෝ නොපිරවීම සම්බන්ධයෙන් අවසන් තිරණය ගැනීම සබරගමුව පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

ඩබ්. ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත
2026.02.19

ඩබ්.ආර්. දිනීෂා එස්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
සබරගමුව පළාත

# ආදර්ශ අයදුම්පත්‍රය

සබරගමුව පළාත් සභා රාජ්‍ය සේවයේ තාක්ෂණ සේවයේ සත්ත්ව සංවර්ධන උපදේශක) තනතුරුවල
III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2026

OPEN COMPITITIVE EXAMINATION FOR RECRUITMENT TO POSTS IN THE TECHNICAL SERVICE OF THE SABARAGAMUWA PROVINCIAL PUBLIC SERVICE LIVESTROK DEVELOPMENT INSTRUCTOR GRADE III – 2026

---

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
(අදාල අංකය කොටුව තුළ ලියන්න )
සිංහල - 1
දෙමළ - 2

01. අ. මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම :-
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් උදා : GUNAWARDHANA, M.G.B.S.K.)

ආ. සම්පූර්ණ නම:-
( සිංහලෙන් / දෙමළෙන්)

ඇ. සම්පූර්ණ නම :-
( ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

ඈ. ජාතික හැඳුනුම්පත් අංකය:-

ඉ. දුරකථන අංකය:-

02. I. ස්ථිර ලිපිනය :-

II. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :- රත්නපුර කෑගල්ල

III. අයදුම්පත් භාර ගන්නා අවසන් දින වන 2026.03.20 දිනට සබරගමුව පළාතේ ස්ථිර පදිංචි කාල සීමාව
අවුරුදු :- මාස :- දින :-

03. I. ස්ත්‍රී/ පුරුෂ භාවය :- (අදාල අංකය කොටුව තුල ලියන්න.)
ස්ත්‍රී-1, පුරුෂ-0

II. උපන්දිනය :- වර්ෂය මාසය දිනය

I. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය වන 2026.03.20 දිනට වයස :-
අවුරුදු මාස දින

04. අධ්‍යාපන සුදුසුකම්

**4.1 අ.පො.ස (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර**

වර්ෂය : විභාග අංකය :

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

**(ප්‍රතිඵල සහතිකයේ ඡායා පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය)**

**4.2 අ.පො.ස(උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර**

වර්ෂය : විභාග අංකය :

| විෂයය | සාමාර්ථය |
|---|---|
| | |
| | |
| | |

**(ප්‍රතිඵල සහතිකයේ ඡායා පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය)**

4.3 තාක්ෂණ සුදුසුකම්:

| ආයතනය | හදාරා ඇති පාඨමාලාව | කාලසීමාව | සාමාර්ථය | සහතිකපත් අංකය හා වලංගු දිනය |
|---|---|---|---|---|
| | | | | |

**(ඩිප්ලෝමා සහතිකයේ ඡායා පිටපතක් අයදුම්පතට අමුණා එවිය යුතුය)**

(මෙම තොරතුරු පැහැදිලිව හා නිවැරදිව සඳහන් කර නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ )

05. විභාග ගාස්තු ගෙවූ ලදුපත් අංකය:-

විභාග ගාස්තු ගෙවූ කාර්යාලය:-

ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න

*( ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)*

06. අයදුම්කරුගේ සහතිකය

.......................................................වන මා විසින් මෙම අයදුම්පත්‍රයේ සපයා ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව සහතික කරමි. මා විසින් සපයා ඇති තොරතුරු සාවද්‍ය යයි සොයාගනු ලැබුවහොත් මා විසින් ඉල්ලුම් කර ඇති ඉහත තනතුරට පත් කිරීම සඳහා වූ මාගේ හිමිකම නෙසලකා හරිනු ලැබීමටද මට විරුද්ධව විනයානුකූලව කටයුතු කරනු ලැබීමටද හැකි බව මම හොඳාකාරවම දනිමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් පනවනු ලබන නීති රීති වලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය:- ........................................

අයදුම්කරුගේ අත්සන

**අයදුම්කරුගේ අත්සන සහතික කිරීම**
**( අනවශ්‍ය වචන කපා හරින්න )**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන ........................................................... මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව හඳුනන බවත්, ඔහු/ඇය .................................... දින මා ඉදිරිපිටදී ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවත් සහතික කරමි.

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම:-

අත්සන :-

තනතුර හා නිල මුද්‍රාව

(මෙම සහතිකය රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිලධාරියෙකු, හෝ රජයේ මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.)

**රජයේ හෝ පළාත් රාජ්‍ය සේවාවන්හි දැනට සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා**
**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය ( අනවශ්‍ය වචන කපා හරින්න )**

.............................................................................................................. මයා/මිය/මෙනවිය දැනට ............................................................................ අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ / ආයතනයේ ........................................................ වශයෙන් ස්ථිර විශ්‍රාම වැටුප් සහිත තනතුරක සේවයේ යෙදී සිටින බවත්, ඔහුට/ඇයට විරුද්ධව විනයානුකූලව කටයුතු කර නොමැති බවත්, විනයානුකූලව කටයුතු කිරීමට අදහස් කර නොමැති බවත්, ඉහත සඳහන් තොරතුරු නිවැරදි බවත්, සහතික කරන අතර, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඔහු/ඇය තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරණ තනතුරින් නිදහස් කළ හැකි බවත් නිර්දේශ කරමි.

දිනය :-

........................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
( නිල මුද්‍රාව තබන්න)